# "ගෙන එන්න දෙයක් නැතුවා"

රෝහණ කරුණාරත්න

මිනිස් සිත වූ කලි මිනිසාගේ පැවැත්මට අත්‍යවශ්‍ය බලපෑමක් කරන ප්‍රධානතම අංගයකි. කායික වශයෙන් මෙන්ම මානසික වශයෙන් ද එහි වැදගත්කම අතිවිශාලය. බුදු දහමට අනුව සලකන විටද,

"මනො පුබ්බංගමා ධම්මා - මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පදුට්ඨෙන - භාසති වා කරොති වා
තතො නං දුක්ඛ මන්වෙති - චක්කංව වහතොපදං"

"මනො පුබ්බංගමා ධම්මා -මනො සෙට්ඨා මනොමයා
මනසා චෙ පසන්නෙන - භාසති වා කරොති වා
තතො නං සුඛ මන්වෙති - ඡායාව අනපායිනී"

**(ධම්මපදය, යමක වග්ග, 1, 2 ගාථා)**

යනාදී වශයෙන් ධම්මපදය අපට කියා දෙන පරිදි අප විසින් කරනු ලබන සියලු කුසල්, අකුසල් ක්‍රියාවනට මුල් වන්නේ සිතයි. දුෂ්ට වූ සිතින් යුතුව අප කරන දේ අප පසුපසම ඇදී එන්නේ ගැලෙගි බැඳි ගවයා පසුපසින් රිය සක, නැතහොත් කරත්ත රෝදය ඇදී එන්නාක් මෙනි. නපුරු සිතින්, දුෂ්ට සිතුවිලිවලින් අප කරන හැම ක්‍රියාවකම අයහපත් ප්‍රතිඵල අප පසුපසම ඇදී එන්නේ ඉහත දැක්වූ පරිදිය. එය කිසිසේත්ම වළක්වාගත නොහැකිය. අනික් අතට, යහපත් සිතුවිලි පෙරටු කොටගත් අපගේ ක්‍රියාවල යහපත් ප්‍රතිඵල අප පසුපසින් එන්නේ අපගේ සෙවණැල්ල මෙනි. එසේ නම් සිත, සියලු දේට, එනම් අප කරන සියලු පව් පින් ක්‍රියාවලට මුල් වන ප්‍රධාන ඒකකයයි.

මෙය මිනිස් සමාජයට අදාළ සනාතන ස්වභාවයක් බව අවිවාදයෙන් පිළිගැනෙන්නකි. අප විසින් කරන ලද කිසියම් යහපත් ක්‍රියාවක් ගැන යළියළිත් අප සිතන්නේ සැබවින්ම සතුටු සිතිනි. එමෙන්ම සිතාමතා හෝ නොදැනුවත්වම හෝ අප අතින් සිදු වූ වැරදි ක්‍රියාවක් ගැන නිරන්තරයෙන් අපගේ මනස අපට දොස් නගන බව ද අමුතුවෙන් කිවමනා නොවේ. එවැනි අත්දැකීම් හෝ මතකයන් රහිත පුද්ගලයෙක් සොයා ගත නොහැකි තරම් වන්නේය. පුද්ගලයකුගේ සිත කොයිතරම් නම් එම පුද්ගලයාගේ පැවැත්මට හා ක්‍රියාවන්ට මුල් වේද යන්නට මෙයටත් වඩා පැහැදිලි කිරීමක් අවශ්‍ය නොවන තරමිය.

ආගමික අතින් බලන විට මිනිස් සිත පිළිබඳ මෙම තත්වය සනාථ වන්නා සේම සමාජය විෂයයෙහි ද මෙහි වැදගත්කම අප්‍රමාණය. සමාජයක් තුළ සාමූහිකව ජීවත් වන මිනිසුන් එකිනෙකා අතර හොඳහිත වර්ධනය කරගැනීම හැම දෙනාගේම යහපැවැත්මට අත්‍යවශ්‍ය වෙයි. අන්‍යෝන්‍ය වශයෙන් හොඳහිත පවත්වාගැනීමට සමාජයක ජීවත් වන අපි කොතරම් ප්‍රබල උත්සාහයක යෙදිය යුතු වෙමුද ? එදා ගැමි පරිසරයෙහි ජීවත් වූ ජනතාව මේ සඳහා නිරායාසයෙන්ම යොමු වූ සරල පැවතුම් හා කතාබහ කොතෙක් වීද යන්නද වටහාගැනීම අපහසු නොවේ. සාමාන්‍යයෙන් සරම හෝ අමුඩය ඇඳගෙන ගමේ සැරිසරන හා කුඹුරේ වැඩ කරන ගැමියෙක්, උඩුකය වැසෙන සේ ඇඳුමකින් සැරසී, තුවායක් වැහි දෙයක් උරය මත දරාගෙන ගියර දිගේ ඇවිද යනු තවත් ගැමියකු දුටුව හොත්, "බෑරක්ද?" යන තනි වචනයෙන් වුව අසන සුහද ප්‍රශ්නය නුදෙක් ප්‍රශ්නයක්ම නොව අන්‍යෝන්‍ය සුහදතාව වර්ධනය කිරීමට පළ කරන ප්‍රකාශයකි. සාමාන්‍ය ඇඳුමකට වඩා වෙනස් ඇඳුමකින් සැරසී ගමන් කරන අතික් ගොවි මහතකු හෝ වෙනත් අයකු 'බැහැරක්', එනම් ගමෙන් පිට දුරගමනක් යන විට අමුතුවෙන් ඇසිය යුතු ප්‍රශ්නයක් නොවන නමුත් එම ප්‍රශ්නයත්, ඊට ලැබෙන පිළිතුරත් මගින් එම පුද්ගලයන් දෙදෙනා අතර පවත්නා සුහදතාව තවදුරටත් ශක්තිමත් වීමක් සිදු වෙයි. එසේ නොකරන අවස්ථාවක් එවන් ගැමි පරිසරයක සාමාන්‍යයෙන් දක්නට නොලැබුණ තරමිය. කලාතුරකින් හෝ එවන් අවස්ථාවක් වුව-හොත් පුද්ගලයන් දෙදෙනකු අතර නොහොඳ නෙ-ර්ක්කාඩු පවත්නා බව එයින් ප්‍රදර්ශනය වෙයි.

එබඳු සමාජ පසුබිමක් නූතන ගැමි පරිසරය තුළ ද ඒ ආකාරයෙන් දක්නට නොමැති වන අතර ඒ වෙනුවට ඇතැමුන්ගේ සිත් තුළ වැසඩම්න් පවතින්නේ යහගුණ නොව අයහපත්, ද්වේශ සහගත සිතුවිළිය. වාණිජත්වයට මුල් තැන දෙමින් යන වර්තමාන සමාජයෙහි එකිනෙකා අතර හොඳහිත පවත්වාගැනීමේ වැදගත්කම අවබෝධ නොවන තරමිය. තමන් පමණක් නොව තම දූ දරු-වන් පවා තරගකාරී වාතාවරණයකට යොමු කරන අපගේ වැඩිහිටියෝ වැඩිවැඩියෙන් මුදල් ඉපයීම හා සමාජයේ ඉහළට යාම පමණක් අරමුණු කොටගෙන ක්‍රියා කරති. එවන් සමාජ පසුබිමක 'හොඳ හිත' නම් සංකල්පය කල් නොයවාම දුරින් දුරු වී යන්නට ඉඩ ඇත. පුද්ගලයන් වූ කලි, පොදුවේ හැම දෙනාගේම යහපත අපේක්ෂා නොකරමින්, ඔවුනොවුන් පරදවා තනිවම ඉහළට යන්නට තැත් කරන පිරිසක් බවට අද සමාජයේ පත් වී ඇති බව අමුතුවෙන් කිව යුතු නොවේ. වැඩිහිටියන්ගේ මග පෙන්වීම හා උපදෙස් අනුව දරුවන් ද එලෙසින්ම ආත්මාර්ථකාමී දිවි පෙවෙතක් ගෙවන සමාජ පසුබිමක් අද ශ්‍රී ලංකාව තුළ වේවා, විදේශ රටවල වේවා දැකගත හැකි ඛේදනීය තත්වයක් කියා පායි. මෙවන් වාතාවරණයක් තුළ ගුරු ගෞරවය මෙන්ම යහපත් ගුරු.ගෝල සබඳතාවක් ද දැකගත හැකි වීම උගහටය.

"ගුරු සිත නොරිදවා
වේලාව නොවරදවා
බැති පෙම උපදවා
අකුරු උගනී කුමරු සොඳවා"

මේ එකල සමාජයේ ආදර්ශවත් සිසු චරිතයක් ලෙස පිළිගැනුණ තත්වයයි. රුසිත නොරිදවන්නේත්, අන්‍යෝන්‍ය වශයෙන් බැතිපෙම උපදවමින් අකුරු උගන්නේත් යහපත් ගුරු.ගෝල සබඳතාව පැවති නිසයි. වත්මන් යුගය වන විට මෙවැනි යහපත් ආකල්ප ද සමාජයෙන් බැහැර වී ඇති බවට සාක්ෂි දැකගත හැකිය. තමනට ශිල්ප දෙන ගුරුවරයා තමන් වෙත දක්වන සැබෑ ආදරය හා කරුණාවත්, තම දියුණුව ඉත සිතින් පතනු මිස මුදල ගැහ නොසිතන බවත් ශිෂ්‍යයන්ට අවබෝධ වන ලෙස කටයුතු කරන ගුරුවන්ගේ සංබාව අද පහළ බසිමින් පවතී. පාසල තුළ පන්තියේදී තමන්ගෙන් අකුරු උගන්නා දරුවනට, සවස් වරුවේ හෝ සති අන්තවලදී තමන්ගේ පෞද්ගලික උපකාරක පන්තිවලට එන ලෙස බල නොකොට, බල කරන ඇතැම් ගුරුවරගුරුවරියන් ශිෂ්‍ය ප්‍රජාව ඉදිරියේ කෙසේ නම් ගෞරවයට පාත්‍ර විය හැකි වනු ඇද්ද ? කෙසේ නමුදු වර්තමාන සමාජය තුළ යථා ස්වභාවය බවට බොහෝ දුරට පත් වී ඇති මෙම තත්වයේ වෙනසක් විරල වශයෙන් හෝ දැක ගැනීමට ද අපි වාසනාවන්ත වෙමු.

වර්තමාන ශ්‍රී ලාංකික ජන සමාජය ඉහත කී අයුරින් හොඳ හිත අගය කරන්නට බහුල වශයෙන් යොමු නොවුවද අද පවා එවැනි යහපත් දේට ගරු කරන්නෝ අල්ප වශයෙන් හෝ අප සමාජය තුළ වෙසෙති. ඒ සමගම ගුරු.ගෝල දෙපක්ෂය අතර සුහද සම්බන්ධතා පවත්වන්නෝ ද අද විරල වශයෙන් හෝ අපට හමු වෙති. ශ්‍රී ලාංකිකයකුගේ ඇසින් බලන විට, තම සමාජය තුළ විරල වශයෙන් හෝ දක්නට ඇති හොඳ හිත, ඇතැම් විදේශ සමාජවල දක්නට නොලැබෙන බව පවසන ගීත රචකයකු, විදේශයක ජීවත් වන ශිෂ්‍යයකු බැහැ-දකින්නට ගිය ගුරුවරයකු හා එම ශිෂ්‍යයා අතර වන සංවාදයක් ලෙසින් රචනා කළ මනහර ගී පදමාලාවක් අපගේ විශේෂ අවධානයට යොමු විය. වසන්ත කුමාර කොබවක නම් වූ විශිෂ්ට ගීත රචකයා විසින් නිර්මාණය කරන ලදුව, අපගේ සංගීත ක්ෂෙත්‍රයට මහඟු සම්පතක් වන ප්‍රවීණ ගායක, සංගීත විශාරද වික්ටර් රත්නායකගේ

සම්මානිත මොහොත්ය
කුසුමා කරුණාරත්න

සංගීතයෙන් ඔපවත් වී, වික්ටර් රත්නායක . රෝ-හණ කරුණාරත්න යන ගුරු.ගෝල යුග්මය විසින් ගායනා කරන ලදුව අප වෙත දායාද කොට ඇති එම යුග ගීයේ මතරම් පදමාලාව පහත දැක්වෙන පරිදිය.

"ගෙන එන්න දෙයක් නැතුවා -
හොඳහිතම අරන් ආවා
බෝ හිඟය කියා හිතුණා -
දුරු රටක වුවද හිතිනා
මිතු අසුර නුයෙන් බැඳෙනා -
ගුරු සුවඳ නොහිමි හමනා
ඔබ සිටින යනෙන කොතැනා -
යහ ගුණය පිරි දිළෙනා

නෙකසාද තෙපුල් මධුරාව ගිගුම් -
සඳ පාන වුවත් ගිනි ගැනෙන තරම්
මෙත් අරණ මැදින් යන ගමන උතුම් -
මම තිබඳ රකිම් ඔබ වෙතම දෙමින්
ගුරු දෑත සුපෙම් මම සිඹිම් ඉතින් -
සිඹ සොයුරු නදින් ප්‍රතිරාව නගම්

ගෙන එන්න දෙයක් නැතුවා -
හොඳහිතම අරන් ආවා
බෝ හිඟය කියා හිතුණා -
දුරු රටක වුවද හිතිනා

මල් යාය වුවත් මිලින වෙයි දිනෙන්
නිල් සේල ගඟත් දිය සිඳෙයි සැණින්
සිත එකලු කරන් ඉන් පහන් දොරින්
ඔබ සොයම් හිතින් නව අරුණු මැදින්

පුර පෝය ලෙසින් මට සොයුරු රැකුම
හඳ එළිය කරන් ලොව දකිම් තුටින්

ගෙන එන්න දෙයක් නැතුවා ....."

| | |
|---|---|
| පද රචනය- | වසන්ත කුමාර කොබවක |
| සංගීතය - | විශාරද වික්ටර් රත්නායක |
| ගායනය - | විශාරද වික්ටර් රත්නායක<br>රෝහණ කරුණාරත්න |

මෙම ගීතයෙන් ප්‍රකාශිත පුළුල් අරුත ශ්‍රී ලාංකික සංස්කෘතියට බෙහෙවින් අදාළ වන්නකි. දරුවනට, ගුරු දෙගුරු, දෙමාපිය, වැඩිහිටි සියලු දෙනා ගෞරවනීය අය වෙති. එමෙන්ම වැඩිහිටියෝ ද දරුවන්ට දක්වන ආදරය හා කරුණාව අසීමිතය. බුද්ධ දේශනාව පරිදි ද, සමාජය තුළ මෙබඳු අන්‍යෝන්‍ය සම්බන්ධතා මෙන්ම යුතුකම් හා වගකීම් ද සිඟාලෝවාද සූත්‍රය වැනි සූත්‍ර දේශනාවලින් මනාව පෙන්වා දී ඇත. ගුරුවරු වූ කලි දරු-වන්ගේ දෑස් පාදමින්, මනස පෝෂණය කරමින්, ගුණදම් කියා දෙමින් යහමග කරා දරුවන් යොමු කරවන උතුම් වූ පිරිසකි. එවන් ගුරුවරුන් කෙරෙහි සිසු දරුදැරියන්ගේ හදවත් තුළ ද පැවතිය යුත්තේ අසීමිත භක්තියකි, ගෞරවයකි, සුහද සබඳතාවකි.

වසන්ත කුමාර කොබවක ගීත රචකයා මෙම ගී පද නිර්මාණයේදී වැඩි අවධානයක් යොමු කර ඇත්තේ විදේශගත වී සිටින තම ශිෂ්‍යයකු බැහැර දැකීමට ගුරුවරයකු යන ගමනක් පිළිබඳ අවස්ථාවකටය. මෙය-න් කියවෙන තවත් බොහෝ අරුත් සහෘද-යාට එමගින් තෝරා බේරාගෙන සිත්ගි දරාගැනීමට ගීත රචකයා ඉඩ සලසා ඇත. ශ්‍රී ලංකාව තුළ වෙසෙන බොහෝ සංගීතඥයන් හෝ අන් කවර කලාකරුවන් වුව, සාමාන්‍යයෙන් වස්තු සම්භාරයක් එක්රැස් කොටගෙන, සුඛෝපභෝගී ජීවිත ගෙවන්නන් නොවන බව පිළිගත හැක්කකි. එසේ වුවද ඔවුන් සතු මහඟු වස්තු සම්භාරයක් ඇත. ඒ, ඔවුන් දැන උගත් විශිෂ්ට ශිල්ප ශාස්ත්‍රයන්, ජීවිතය පුරා එක් රැස් කරගත් යහගුණත්ය. ඉතින් එවැනි ආදරණීය ගුරුවරයකුට, විදේශයක දිවි ගෙවන තම ශිෂ්‍යයා වෙත ගෙන යා හැකි අන් වටිනා තෑගි බෝග නැති විය හැකිය එහෙත් ඔහු එසේ යන්නේ හිස් අතින් නම් නොවේ. එදා මෙදාතුර ශිෂ්‍ය ප්‍රජාව වෙත තමන් පෑ ආදර කරුණාව සමග ඔවුන් වෙත පතළ හොඳ හිත නම් වූ වටිනා ත්‍යාගය ද රැගෙනය.

ගීත රචකයා මෙහිදී තව දුරටත් ඉඟියෙන්ම නොව පැහැදිලිවම කියා පාන වෙනත් අරුතක් ද ගීතය තුළින් අපට උකහාගත හැකිය. "බෝ හිඟය කියා හිතුණා. දුරු රටක වුවද හිතිනා" තමන් උපන් රට අතහැර වස්තු හා සම්පත් සොයා හිමි විරෝධී ලෙස මුහුදු ගමනේ යෙදෙන කොතරම් නම් දෙනා ගැන අද අපට අසන්නට ලැබේද ? ඔවුන් එසේ විදෙස් රටවලට රහසින් හෝ ගොස් ඇතුල් වන්නට තනන්නේ තම දේශය තුළ නොමැති සුර සැප එහි ඇතැයි යන අමනෝඥ අපේක්ෂාවෙනි. එවැනි අයහපත් මාර්ගවලින් නොව යහපත් ලෙස, තිවැරදි ලෙස දුරු රටකට සංක්‍රමණය වී එහි දිවි ගෙවන ශ්‍රී